**ශීර්ෂ 266 – වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

---

(අ) වවුනියාව
(ආ) වෙන්ගලචෙඩ්ඩිකුලම
(ඇ) වවුනියාව දකුණ
(ඈ) වවුනියාව උතුර

**1.1 විගණන විෂය පථය**

---

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වු කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 28 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබි ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වු ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **ගිණුම්**

**2.1** **විසර්ජන ගිණුම**

**(අ)** **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 303.5 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 298.3 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.2 ක් හෙවත් සියයට 1.7 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 155.4 | 150.5 | 4.9 | 3.2 |
| මූලධන | 148.1 | 147.8 | 0.3 | 0.2 |
| **එකතුව** | **303.5** | **298.3** | **5.2** | **1.7** |

**(ආ)** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 22 කින් හා දෙපාර්තමේන්තු 18 විසින් පිළිවෙලින් රු. මිලියන 747.30 ක් හා රු.මිලියන 992.43 වශයෙන් එකතුව රු.මිලියන 1,739.73 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 697.80 ක් හා රු.මිලියන 783.88 වශයෙන් එකතුව රු.මිලියන 1,481.68 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය පිළිවෙලින් රු.මිලියන 49.50 ක් හා රු.මිලියන 208.55 වශයෙන් එකතුව රු.මිලියන 258.05 වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26601 | 11 | 10.9 | 7 | 8.7 | 40 | 35.2 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 96.91 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.13 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි |
| (ඈ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

වැය විෂයන් 3 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15.8 ක සිට සියයට 28.77 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මනිපුරම් ගම්මානයේ දිවිනැගුම සංවර්ධන සමිතියේ සාමාජිකයින් යැයි හඳුනාගන්නා ලද ප්‍රතිලාභින් 52 දෙනෙකුට රු.9,000 බැගින් ද, ප්‍රතිලාභින් 05 දෙනෙකුට රු.4,400 බැගින්

ද, වශයෙන් එකතුව රු.490,000 ක් ගෙවා තිබුණි. එම ප්‍රතිලාභ ලබාගත් බවට ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කළ ලේඛනයේ අත්සන් සහ සමෘද්ධි බැංකුවෙන් මුදල් ලබාගත් බවට ඉදිරිපත් කරනු ලැබූ අත්සන් අතර වෙනසක් පැවැතුණි.

(ආ) 2014 නොවැම්බර් 07 දිනැති අංක MED/RD/DEV/2014 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මූලික නිර්නායකය ලෙස අඩු ආදායම් ලාභියකු ලෙස අවධාරණය කර තිබුණත්, ඊට පටහැනිව මණිපුරම් හා මරක්කරම්පලෛයි ගම්මානවල පදිංචි ඉහල ආදායම්ලාභි පවුල් වෙත (ස්ථිර රක්ෂාවක් තිබෙන) සහ අවිවාහක පුද්ගලයින් වෙත ප්‍රතිලාභ වශයෙන් රු.100,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DDD/Z6/MF/2014 දරන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රාදේශිය දිවිනැගුම සංවර්ධන නිලධාරින් ඇමැතු ලිපිය ප්‍රකාරව දොරින් දොරට ගමින් ගමට සංවර්ධන ව්‍යාපෘති දිවිනැගුම සංවර්ධන සමිති හරහා ක්‍රියාත්මක කළයුතු බවට අවධාරණය කර තිබුණත්, ඊට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සැලැසුම්ගේ උපදෙස් සහ මඟ පෙන්වීම් මත විවිධ සංවිධාන 4 ට රු.3,430,000 ක් ගෙවා තිබුණි. මේ නිසා අඩු ආදායම්ලාභි නොවන ප්‍රතිලාභින් වෙතද ව්‍යාපෘතියේ මුදල් ගෙවා තිබුණි. එමෙන්ම එකී සංවිධාන දෙකක සාමාජිකයින් වෙත අනෙකුත් දිවිනැගුම සමිතිවල ප්‍රතිලාභින්ට ගෙවූ මුදලට වඩා වැඩි මුදලක් ගෙවා තිබුණි.

(ඈ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DDD/Z6/MF/2014 දරන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රාදේශිය දිවිනැගුම සංවර්ධන නිලධාරින් ඇමැතු ලිපිය මගින් ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටවනු ලැබූ දිවිනැගුම සංවර්ධන සමිතිවල සිටින සාමාජිකයින් ප්‍රතිලාභින් විය යුතු වුවත්, ග්‍රාම නිලධාරි වසමේ පදිංචි නොවන වෙනත් ප්‍රදේශවල පුද්ගලයන්ට ද ගෙවීම් කර තිබුණි. එමඟින් රාජ්‍ය මුදල් නිසි කළමනාකරණයෙන් තොරව බැහැරවී තිබුණි. උදාහරණ ලෙස මහරඹාකුලම ග්‍රාම නිලධාරි වසමේ පදිංචි නොවූ පුද්ගලයින් 61 දෙනෙකුට රු.457,500 ක් ගෙවා තිබීම.

### 3.3 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

.

(අ) වර්ෂ 2 ක් ඉක්ම වූ රු.997,959 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු (හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව) විසින් විවිධ කාර්යන් සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු රු. 400,000 මුදල් අදාළ කාර්යභාර්ය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 26601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,174,681 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

### 3.5 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (I) මුදල් රෙගුලාසි 108 හා 109 | 54,005 | අවුරුදු 25 ට වඩා පැරණි හානි වීම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (II) | මුදල් රෙගුලාසි 94(1) | 3,526,163 | (I) වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි පවුල් සඳහා වැව් පිළිසකර කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට විවිධ පුද්ගලයින්ට සහ ආයතනවලට ගෙවිය යුතු බිල්පත්වල වටිනාකම් විසර්ජන ගිණුමේ DGSA 8 බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. |
| | | 23,990 | (ii) 2014 වර්ෂයේ විවිධ අළුත් වැඩියාවන් සහ මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ වටිනාකම් බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

----------------------

| | | |
|---|---|---|
| 2009 දෙසැම්බර් 9 දිනැති අංක 441 දරන චක්‍රලේඛයේ 3:5 ඡේදය | - | සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, වෙන්දේසි කළ යුතු භාණ්ඩ පිළිබඳ කටයුතු අවසන් කළ යුතු වුවත්, වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේ අපහරණයට යෝජිත භාණ්ඩ වර්ග 61 සම්බන්ධයෙන් අදාළ කටයුතු 2014 පෙබරවාරි 26 දිනට පෙර සිදු කළ යුතු වුවත්, එසේ කිරීමට මණ්ඩලය 2014 ජුලි 10 දින පත්කර තිබුණි. |

**(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන චක්‍රලේඛය | 3,010,908 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු වී තිබුණු සියළුම හානි විසර්ජන ගිණුමේ DGSA 7 ආකෘතියේ ඇතුළත් කර නොතිබුණි. |

**3.6 දේශීය මුල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

වැව් නවීකරණය සඳහා 2013 හා 2014 වර්ෂවල ශීර්ෂ 281 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ශීර්ෂ 226 වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පිළිවෙලින් රු.මිලියන 7.732 ක් හා රු.මිලියන 39.996 ක් වශයෙන් රු.මිලියන 47.728 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 3.526 ක බැදීම්ද ඇති කර ගෙන වැව් 16 ක වැඩ ආරම්භ කර තිබුණි. එම වැව් 16 කින් 09 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවසන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15.5 ක වැය කර නවීකරණය කරන ලද කම්බිලියාව වැවේ, වැව් බැම්මේ ස්ථානයක් කැඩී තිබුණු අතර එය සම්පූර්ණ කර නොතිබුණි. මෙම වැව් නවීකරණ ව්‍යාපෘතියට අදාල ශාක්‍යතා අධ්‍යයන වාර්තා හා ව්‍යාපෘති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.7 කාර්යසාධනය**

වවුනියාව දිස්ත්‍රික්කයේ දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි පවුල් වෙත පානීය සහ කෘෂිකාර්මික ජල අවශ්‍යතා සඳහා ළිං 100 ක් ඉදිකිරීම සඳහා 2014 දෙසැම්බර් 03 දින වන්නි ආරක්ෂක මූලස්ථානය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වන්නි ආරක්ෂක මූලස්ථානය වෙත රු.මිලියන 20 ක් ගෙවා තිබුණි. 2015 මාර්තු 12 දින වන විටත් එම ළිං ඉදිකර නොතිබුණි. 2015 සැප්තැම්බර් 10 දින වන විට වැඩ නිම කළ ළිං 34 ක්ද, ඉදිකරමින් පවතින ළිං සඛ්‍යාව 43 ක්ද හා එදින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණු ළිං සංඛ්‍යාව 23 ක් බව වාර්තා වී තිබුණි.

**3.8 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වවුනියාව සහ සෙට්ටිකුලම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 42.135 ක් ලබා දී

තිබුණි. අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සමෘද්ධි බැංකු වෙත එක් එක් ප්‍රතිලාභියා හඳුනා ගැනීමෙන් පසු (ප්‍රතිලාභි නාම ලේඛනයට අනුව) ගෙවීමට උපදෙස් දී තිබුණි. එකී උපදෙස්වලට පටහැනිව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සැලැසුම්ගේ වාචික උපදෙස් මත සමිති සංවිධානවලට සෘජුවම ගෙවා තිබුණි. මෙසේ ගෙවා තිබීම හේතුවෙන් මුල්‍යමය අක්‍රමිකතාවන් සිදු වීමට ඉඩ තිබු බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ආ) අර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා ඊට අදාළ ප්‍රතිලාභින්ට ගෙවීම් කිරීමේදී දිස්ත්‍රික් සැලැසුම් ඒකකය විසින් ප්‍රතිලාභි එක් එක් පවුල් සඳහා රු.49,000, රු.10,000, රු. 9,000, රු.7,800, රු.6,500 හා රු.2,500 ආදි වශයෙන් ගෙවීම තිරණය කර තිබුණි. එසේ තීරණය කළ මුදල් පොදු 36(අ) ආකෘතියේ අත්සන් ලබා ගෙන ප්‍රතිලාභින් වෙත ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පොදු 36(අ) ආකෘතියේ අත්සන් කරන ලද මුදලට අඩුවෙන් ප්‍රතිලාභ ගෙවා තිබුණු අවස්ථා හා කාතර්සින්න කුලම් ගම්මානයේ පුද්ගලයින් 06 දෙනෙකු වෙත ගෙවා තිබුණු බව සඳහන් රු.60,000 ක මුදලක් එසේ ඔවුන් වෙත නොගෙවා මුල්‍යමය අක්‍රමිකතාවයන් සිදු කර ඇති බව අනාවරණය විය.

**3.9 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පොතෙන් ඉවත් කිරීමට අනුමැතිය ලබා ගත් වාහන අනතුරු 2 ක් ඇතුළු වෙනත් විවිධ පාඩු හා හානි 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළ නිවස සහ ග්‍රාම නිලධාරි කාර්යාල 20 ක Floor Polisher, camera, පුටු හා මේස ඇතුළු භාණ්ඩ වර්ග 22 ක් අඩුවීම පිළිබඳව මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අභාවයට ලක්ව තිබු වැව් නවීකරණ ව්‍යාපෘතියට අදාලව මිලදී ගෙන තිබු රු.1,045,031 ක් වටිනා ගේට්ටු සහ උපාංගවලින් රු.406,258 ක් වටිනා උපාංග එකී වැව් ව්‍යාපෘතිය සඳහා භාවිතයට නොගෙන තිබු අතර විගණිත

දිනය  වූ 2015 අප්‍රේල් 30 දින වන විටත් භාවිතයට නොගත් උපාංග ප්‍රාදේශිය ලේකම් භාරයට ගෙන නොතිබුණි. එකී උපාංග අතර වටිනාකම රු.194,880 ක් වූ ව්‍යාපෘතියට අදාල නොවූ උපකරණ ද (Guide Brackets) මිලට ගෙන තිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මඟින් රෙදි මහන පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 49 ක් ආරම්භ කර තිබුණි. එකී පුහුණු කිරීමේ මධ්‍යස්ථාන වෙත ලබාදී තිබූ මහන මැෂින් සහ උපාංගවල ආරක්ෂාව සඳහා මුරකරුවන්ද, අධීක්ෂණ කටයුතු සඳහා නිලධාරින්ද යොදවා තිබුණි. මුර සේවය කරන පුද්ගලයින්ද එකී සේවාවේ යෙදී නොසිටි බවටත්, පුද්ගලික නිවාසවල පවත්වා තිබූ මධ්‍යස්ථානවලට මුරකරුවන් යෙදීම අනවශ්‍ය බවත් සඳහන් කර තිබුණු බැවින් ඒ සඳහා වැය කළ රු.1,245,567 ක මුදල මතභේදාත්මක ගනුදෙනුවක් වී තිබුණි.

**3.12 විසදා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද වලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේද වලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2005-2013 | 2.2( ඈ) | පොදු තැන්පත් ගිණුම් |
| 2013 | 1.5 (අ ) | පොත්පත් හා ලේඛන යාවත්කාලීන නොකිරීම. |

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 17 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 15 | 07 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 324 | 224 | 100 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 55 | 13 | 02 |
| | **එකතුව** | **425** | **303** | **124** | **02** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 124 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.